# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.06.05

වේලාව - ප.ව. 02.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - **එම්.ඒ.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)**

සහභාගී වූ නිලධාරීන්,

- **ඩබ්ලිව්. එම්. දයාවතී මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්. බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා.**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **චම්පිකා පතිරණ මිය.**
  **ප්‍රධාන අභ්‍යන්තර විගණක**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්ෂ (අයවැය)**
- **ජී.ඩබ්ලිව්.පී. පෙරේරා මිය.**
  **අධ්‍යක්ෂ (ඉංජිනේරු)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **ටිෂානි රාමනායක මිය.**
  **අධ්‍යක්ෂ (සැලසුම්)**
- **එම්.ඩබ්ලිව්.එස් කුරේ මයා.**
  **අධ්‍යක්ෂ (ආදායම් හා මුදල්)**
- **පී. කණිෂ්ක ශ්‍රී ලාල් මයා.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

## සාකච්ඡා කරන ලද කරුණු

### පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව "සහකාර අධ්‍යක්ෂ" තනතුර | නව "සහකාර අධ්‍යක්ෂ" තනතුර වෙනුවෙන් සුදුසු පුද්ගලයකු බඳවා ගැනීම සඳහා වූ සේවා ව්‍යවස්ථාව මේ සතිය ඇතුළත ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | රියදුරන් සහ වාහන හිමි මාණ්ඩලික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | රියදුරන් සඳහා පවත්වන ලද පුහුණු සැසිය 2017.05.29 හා 30 දෙදින පුරා පැවැත්වූ බවත්, ඒ සඳහා රියදුරන්ගේ අඩු සහභාගිත්වයක් දක්නට ලැබුණු බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදි.<br>ඉදිරියේ දී රියදුරන් සඳහා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් ව පුහුණු සැසියක් සංවිධානය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ නිර්දේශ පරිදි ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ මූලිකත්වයෙන් ප්‍රායෝගික පුහුණු සඳහා උපකාරී වන ආදර්ශ මාර්ගයක් තැනීමට ඇති හැකියාව සලකා බලන ලෙස ප්‍රධාන ලේකම්ට දැන්විය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

### සැලසුම් අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සැලසුම් අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන නිලධාරීන් සඳහා උපකරණ මිලට ගැනීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරනු ලබන අදාළ නිලධාරීන් සඳහා අවශ්‍ය උපකරණ පිළිබඳ (ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් වූ) විස්තර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## ඉංජිනේරු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බත්තරමුල්ල නව ගොඩනැගිල්ල තුල ප්‍රධාන ලේකම් කාර්යාලය ක්‍රියාත්මක මට්ටමින් ස්ථාපනය කිරීම. | නව පරිශ්‍රය වෙත යාමේ දී අපහරණය කළ යුතු, නව මිල දී ගත යුතු භාණ්ඩ සහ ඒවා ඉන්වෙන්ට්‍රිගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳව අභ්‍යන්තර චක්‍රලේඛයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) විසින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ අතර, එය සියලුම කමිටු සාමාජිකයින් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් විය. එය සියලුම අංශ වෙත ලබාදීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 02. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කළුතර කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | පළාත් තක්සේරු සේවයක් ඇති කරමින්, බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත බැවින්, කළුතර කාර්යාලය සඳහා ඉදි කිරීමට නියමිත නව ගොඩනැගිල්ල සඳහා මහල් 04ක් වෙනුවට 05ක් දක්වා වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු විය.<br><br>රුපියල් මිලියන 10ට වැඩි නව ගොඩනැගිලි සම්බන්ධයෙන් සියලුම විශේෂ ව්‍යාපෘති වල විස්තර ඇතුළත් ලැයිස්තුවක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | ආදායම් කොමසාරිස්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## නව යෝජනා

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බත්තරමුල්ල නව පරිශ්‍රය අසල ඇති බස් නැවතුම්පොළ ඉවත් කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ වාහන ගාල් කිරීමේ ගැටලුවක් පවතින බැවින්, ඊට යාබදව ඇති බස් නැවතුම්පොළ සඳහා වෙනත් ස්ථානයක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා පළාත් මාර්ග අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියලු නිලධාරීන් සමඟ සාකච්ඡාවක් 2017.06.07 වන බදාදා දින පෙ.ව.09.00ට සංවිධානය කිරීම.<br><br>බස් රථ නැවැත්වීම සඳහා විකල්ප ස්ථානයක් පිළිබඳ විමසා වාර්තාවක් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | ශ්‍රාවස්ති පරිශ්‍රය ඩෙංගු මදුරුවන්ගෙන් තොර කලාපයක් බවට පත් කිරීම. | ඩෙංගු රෝග ව්‍යාප්තිය මර්දනය කිරීම වෙනුවෙන් ශ්‍රාවස්ති පරිශ්‍රය තුල ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා සෑම බදාදා දිනක ම උදෑසන ජාතික ගීය ගායනය අවසන් වූ පසු සියලුම ආයතන ප්‍රධානීන් නිරීක්ෂණ චාරිකාවක් යාම සහ එම ස්ථාන පිරිසිදු කරලීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 03. | බස්නාහිර පළාත් සංවර්ධන සැලැස්ම ප්‍රගතිය නියාමනය කිරීම සඳහා අන්තර්ජාලය ආශ්‍රිත පරිගණක වැඩසටහනක් (Web based system) සකස් කිරීම. | ව්‍යාපෘතියක් අනුමත කිරීම, ප්‍රගතිය විමසීම ආදී කරුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීම සඳහා අන්තර්ජාලය ආශ්‍රිත පරිගණක වැඩසටහනක අවශ්‍යතාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ප්‍රකාශ කළ අතර, ඒ සඳහා සුදුසු වැඩසටහනක් සැකසීම පිළිබඳ සාකච්ඡා කිරීමට 2017.06.07 වන බදාදා දින පෙ.ව.10.00ට ITRDI ආයතනයේ නිලධාරියකු සම්බන්ධ කරවන මෙන් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | හෝමාගම ගබඩාවත්ත කෘෂිකර්ම පුහුණු භූමියෙන් මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණයක් සඳහා ඉඩම් කොටසක් වෙන් කර ගැනීම. | ඉඩම් විධිමත් ව පළාත් සභාව වෙත පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසත්, අදාළ භූමියේ මිනින්දෝරු සැලැස්ම සකසා ඒ අනුව, නිල නිවාස ව්‍යාපෘතියට අදාළ ඉදිරි සැලසුම් සකස් කර දන්වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් ජූනි 12 දින යෙදීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

.........................................
එම්.ඒ.බී.දයා සෙනරත්,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.